දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 33/2010

ඛ/12/01/පොදු/2010
ගිණුම් අංශය,
බන්ධනාගාර මූලස්ථානය.
2010.11.16

සියළුම කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

## 2010 වර්ෂය සඳහා ගිණුම් පියවීම.

2010 වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක 2010.11.04 දිනැති 212/2010 චක්‍රලේඛය හා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ 2010.11.04 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 6/2010 සම්බන්ධවයි. අදාල චක්‍රලේඛ www.treasury.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබා ගත හැක. එම චක්‍රලේඛ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගිණුම් පියවීමේ කටයුතු පහත උපදෙස් පරිදි සිදු විය යුතු බව අවධාරණය කරනු ලැබේ.

01. 2010 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අත්මුදල් ලබා ගැනීම.

i. 2010 නොවැම්බර් මස ගිණුම් සාරාංශය සකස් කර එහි පිටපතක් හා හිඟ බිල්පත් ලේඛණය රැගෙන බන්ධනාගාර මූලස්ථානයේ නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) සමඟ සාකච්ඡා කිරීම සඳහා ඔබ ආයතනයට වෙන් කර ඇති පහත දිනයේදී නිලධාරියෙකු පැමිණිය යුතුය. ඔබ ආයතනය සඳහා නියමිත දිනයේදීම පැමිණීමට සියළුම නිලධාරීන් කටයුතු කල යුතුය.

2010.12.06 - වැලිකඩ/පල්ලේකැලේ/අනුරාධපුරය/බදුල්ල/වැලිකඩ
2010.12.07 - වීරවිල/තංගල්ල/කුරුවිට/ත්‍රිකුණාමලය/කො.රි.බ.
2010.12.08 - බූස්ස/පල්දෙනා/මැගසින්/මහර/ප.වී.පු.ම.
2010.10.09 - මඩකලපුව/ගාල්ල/මාතර/දුම්බර/කළුතර/වටරැක

ii. ඔබ ආයතනයට දැනට ලබා දී ඇති සියළුම පුනරාවර්තන ප්‍රතිපාදන 2010.11.30 දිනට ශුණ්‍ය කිරීමට කටයුතු කරනු ඇත. හිඟ බිල්පත් ගෙවීම සඳහා ප්‍රතිපාදන හා අත්මුදල් ලබා දී ඇති සියළුම ගෙවීම් අනිවාර්යෙන් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. 2010 දෙසැම්බර් මාසය සඳහා ඔබ ආයතනයට ලබා දීමට නියමිත ප්‍රතිපාදන සීමාව ඉක්මවා (ඒ ඒ වැය විෂයන්වලට අදාලව) කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය. යම් හෙයකින් දෙසැම්බර් මාසය සඳහා ලබා දෙන ප්‍රතිපාදන ඉතිරි වන්නේ නම් ඒ බව කඩිනමින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ෆැක්ස් මඟින් දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. ඔබ ආයතනයට ලබා දී ඇති මූලධන වියදම් ප්‍රතිපාදන 2010.12.31 දිනට යම් ශේෂයක් ඉතිරි වන්නේ නම් ඉතිරිවන ප්‍රතිපාදන ප්‍රමාණය ලිඛිතව බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2010.12.05 වන දිනට පෙර දැනුම් දීමට කටයුතු කල යුතුය.

iv. පසුගිය වර්ෂවල හෝ ප්‍රවර්තන මුදල් වර්ෂයේ වගකීමක් ඉදිරි වර්ෂයට ගෙන නොයාමට වග බලා ගත යුතු අතර දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අත්මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් ගෙවීමට දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වග බලා ගත යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා වියදම් නොදැරීමටත් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් කිරීමටත් කටයුතු කල යුතුය.

ගෙවීම් වවුවර ඒ ඒ ආයතනවල ගිණුම් අංශය වෙත ලබා දීමට සියළුම අංශ ප්‍රධානීන් වග බලා ගත යුතුය.

02. 2010 දෙසැම්බර් 31 දිනට මුදල් පොත පියවීම.

i. ගිණුම් කටයුතු පියවීමේ අවසාන දිනය 2010 දෙසැම්බර් 31 වන දින බැවින් එදිනට පෙර ගමන් වියදම්, ඉන්ධන, සුළු අත්මුදල් ඇතුළු සියළුම අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. දෙසැම්බර් මස අවසාන සති දෙක තුල අත්‍යවශ්‍ය කරුණකට හැර අග්‍රිම අත්තිකාරම් ලබා නොදීමට බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. බන්ධනාගාර ආයතනවල ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය මේ සමඟ අමුණා ඇත. අදාල නිලධාරීන් ඒ ඒ ආයතනවල මුදල් පොත වැසීමේ වගකීම දැරිය යුතුය. 2010.12.31 දිනෙන් පසුව කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකිවන පරිදි එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ තම නම, තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2010 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

iii. **මුදල් පොත වැසීමෙන් පසුව මුදල් පොතේ ඉතිරි ශේෂයේ වටිනාකම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ බෙරැල්ල ලංකා බැංකු ශාඛාවේ ගිණුම් අංක 7041491 ට චෙක්පතක් ලියා බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2010.12.31 වන දිනම අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කල යුතුය. අතින් ගෙනවිත් භාර දීමට නොහැකි නම් චෙක්පතේ ඡායා පිටපතක් ෆැක්ස් මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දීමට කටයුතු කල යුතුය.**

iv. 2011 වර්ෂය සඳහා අවශ්‍ය අත් මුදල් බන්ධනාගාර මූලස්ථානය මගින් ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතුය.

03. මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම

i. 2010 දෙසැම්බර් මස මාසික ගිණුම් සාරාංශය 2011.01.05 වන දිනට පෙර ලබා දිය යුතුය. පළමුවන ගිණුම් සාරාංශයේ යම් කිසි ගිණුම්කරණ දෝෂයක් නිවරදි කිරීම හෝ හරස් සටහන් මගින් කරනු ලබන ගෙවීමක් ගිණුම්ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පරිපූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක. පරිපූරක ගිණුම් සාරාංශය 2011.01.12 වන දිනට පෙර අතින් ගෙනවිත් බන්ධනාගාර මූලස්ථාන ගිණුම් අංශය වෙත භාර දිය යුතුය.

ii. යම් හෙයකින් විශේෂිත කරුණක් නිසා නිරවුල් නොකරන ලද අග්‍රිම අත්තිකාරමක් වේනොත් ඒ පිළිබඳ විස්තර වාර්තාවක් 2011.01.05 වන දිනට පෙර ලබා දිය යුතුය.

iii. බැංකු සැසඳුම් ප්‍රකාශය හා අත්මුදල් සැසඳුම් ප්‍රකාශය 2011.01.12 වන දිනට පෙර ලබා දීමට කටයුතු කල යුතුය.

ගිණුම් කටයුතු පියවීම සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් වේනොත් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) හෝ නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි.

මේජර් ජනරාල් වී.ආර්. සිල්වා
ආර්එස්පී, යූඑස්පී, එන්ඩියූ, අයිජී.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :- විගණකාධිපති

# 2010 වර්ෂයේ ගිණුම් පියවීම සඳහා බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| අංකය | නිලධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|
| 01 | G.M.K. බණ්ඩාර | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) | බන්ධනාගාර මූලස්ථානය |
| 02 | S.P.W.M.R.B. වික්‍රමසිංහ | බන්ධනාගාර අධිකාරී | වැලිකඩ |
| 03 | H.M.T.N. උපුල්දෙනිය | බන්ධනාගාර අධිකාරී | කොළඹ රිමාන්ඩ් |
| 04 | A. හපුආරච්චි | අධ්‍යක්ෂ - පුහුණු | ප.වි.පු.ම. |
| 05 | P.S. බොතේජු | බන්ධනාගාර අධිකාරී | මැගසින් |
| 06 | D.J.K.L. අබේගුණවර්ධන | බන්ධනාගාර අධිකාරී | මහර |
| 07 | C.M.N. චන්ද්‍රසේකර | බන්ධනාගාර අධිකාරී | මීගමුව |
| 08 | H.M.S.B. සේනානායක | සහකාර බන්ධනාගාර අධිකාරී | දුම්බර |
| 09 | G.B. කුලතුංග | බන්ධනාගාර අධිකාරී | මහනුවර |
| 10 | J.A.T. ජයසිංහ | බන්ධනාගාර අධිකාරී | පල්ලේකැලේ |
| 11 | E.M.J.C.B. ඒකනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | යාපනය |
| 12 | A.K.S.K.I. de සිල්වා | සහකාර බන්ධනාගාර අධිකාරී | අනුරාධපුරය |
| 13 | P.R.W.M.A. ඒකනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | බදුල්ල |
| 14 | S.R. ජයවීර ද සිල්වා | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | තල්දෙන |
| 15 | L.J.M.K. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මඩකලපුව |
| 16 | J.A.G. ජයසිංහ | බන්ධනාගාර අධිකාරී | ගාල්ල |
| 17 | K.K.S.U. රංජන් | සහකාර බන්ධනාගාර අධිකාරී | මාතර |
| 18 | A.M.W. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී | වීරවිල |
| 19 | T.I. උඩුවර | සහකාර බන්ධනාගාර අධිකාරී | තංගල්ල |
| 20 | G.M.P. ලියනගේ | සහකාර බන්ධනාගාර අධිකාරී | කෑගල්ල |
| 21 | L.H.E. රංජන් | සහකාර බන්ධනාගාර අධිකාරී | කළුතර |
| 22 | D.W.A. තිස්ස | සහකාර බන්ධනාගාර අධිකාරී | බූස්ස |
| 23 | G.K.L. ප්‍රේමතිලක | සහකාර බන්ධනාගාර අධිකාරී | කුරුණෑගල |
| 24 | H.M.W.N.N. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී | වටරැක |
| 25 | K.A.K.S.N.K. කළුආරච්චි | සහකාර බන්ධනාගාර අධිකාරී | වාරියපොල |
| 26 | A.F. ලාහිරු | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | පොළොන්නරුව |
| 27 | T.U.K. ප්‍රනාන්දු | සහකාර බන්ධනාගාර අධිකාරී | මොණරාගල |
| 28 | R.S. අලහකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | ත්‍රිකුණාමලය |

- යම් හෙයකින් ඉහත බලය පැවරූ නිලධාරියෙකු ස්ථාන මාරු නියෝගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේ නම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කල යුතුය.